# මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය
## மகாவலி அபிவிருத்தி மற்றும் சுற்றாடல் அமைச்சு
## Ministry of Mahaweli Development and Environment

"සම්පත්පාය", අංක 82, රජමල්වත්ත පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
"சம்பத்பாய", இல 82, இராஜமல்வத்த வீதி, பத்தரமுல்ல, இலங்கை.
"Sampathpaya", No 82, Rajamalwatta Road, Battaramulla, Sri Lanka.
Gen.Tel. + 94-11-2882112 - 3

ලේකම් / செயலாளர் / Secretary +94-11-2877290
ෆැක්ස් / தொலை நகல் / Fax +94-11-2877292


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இல<br>My No | 03/02/03/02/07- GSMB | ඔබේ අංකය<br>உமது இல<br>Your No | | දිනය<br>திகதி<br>Date | 2015.09.29 |

පරිසර චක්‍රලේඛය 02/2015

දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරු
සියලුම ප්‍රාදේශීය ලේකම්වරු

## <u>පස් හා බොරළු කැණීම</u>

01. නීත්‍යානුකූල බලපත්‍ර ලබාගැනීමෙන් තොරව කරනු ලබන පස් කැපීම් මෙන්ම ලබාගත් බලපත්‍ර අවභාවිතය හේතුවෙන් මතුවී ඇති ඵාරිසරික ගැටළු මෙන්ම සමාජ ගැටළුවලට විසඳුමක් ලෙස පස් කැණීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් විධිමත් පාලන ක්‍රමයක් ඇති කිරීම සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය හා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය ඒකාබද්ධව විධිමත් ක්‍රියා පටිපාටියක් හඳුන්වාදීමට තීරණය කර ඇත.

02. එබැවින් 2010.10.20 දිනැති අංක 02/06/09 (viii) - GSMB දරන චක්‍රලේඛය පරිදි පස්, බොරළු හා වැලි යන ඛනිජ ද්‍රව්‍යයන් සඳහා භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය විසින් 2009 අංක 66 දරණ සංශෝධිත 1992 අංක 33 දරණ පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනතේ 8(1) හා 8(2) වගන්තිය ප්‍රකාරව බලපත්‍ර නිකුත් කිරීමට ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත බලය පවරන ලද කාර්යයන් තවදුරටත් විධිමත් කිරීමේ අරමුණින් පහත සඳහන් උපදෙස් මාලාව සහිත මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ.

   i. <u>වාණිජ නොවන කාර්යයන් සඳහා</u> කැණීම් කරනු ලබන පස් හා බොරළු යන ඛනිජ ද්‍රව්‍යයන් සඳහා කියුබ 35ක උපරිමයක් දක්වා ස්ථානීය පරීක්ෂාව සිදුකල පසු ග්‍රාම නිලධාරී විසින් ඉදිරිපත් කරනු ලබන ඔහුගේ නිර්දේශ සහිත වාර්තාව, අනුමත ඉදිකිරීමේ සැලැස්ම හා අවශ්‍ය අවස්ථාවන්හි දී අදාළ පළාත් පාලන ආයතනයේ හා මධ්‍යම පරිසර අධිකාරියේ නිර්දේශ සහිතව ප්‍රාදේශීය ලේකම් විසින් පමණක් බලපත්‍ර ලබා දිය යුතු ය. එහෙත් ඒ සම්බන්ධයෙන් මතුවන විශේෂ කරුණු සලකා බලා අවශ්‍ය අවස්ථාවල දී භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ අධීක්ෂණයට ලක් කළ යුතු ය.

   ii. ඉහත පරිදි ප්‍රාදේශීය ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයේ වලංගු කාලය නිශ්චිතව සඳහන් කළ යුතු අතර ප්‍රායෝගික තත්ත්වයන් සළකා බලා එහි වලංගු දින ගණන තීරණය කළ යුතු ය. යම් නොවැළැක්විය හැකි හේතු නිසා සිදුවන ප්‍රමාදයන් සළකා බලා ප්‍රාදේශීය ලේකම් විසින්ම මෙම කාල සීමාව දීර්ඝ කළ යුතු ය.

   iii. කියුබ 35ට වැඩි, <u>වාණිජමය නොවන අවශ්‍යතා සඳහා සිදුකරනු ලබන කැණීම් කටයුතු හා සංවර්ධන ව්‍යාපෘති</u> සඳහා දිස්ත්‍රික් ලේකම්, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය, මධ්‍යම පරිසර අධිකාරිය, මහවැලි අධිකාරිය, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පොලිසිය, ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාව, පළාත් පාලන ආයතනය වැනි අදාළ ආයතන ඇතුළත් දිස්ත්‍රික් කමිටුවක් මගින් බලපත්‍ර ලබා දීම පිළිබඳ තීරණය කළ යුතුය.

   iv. ඉහත iii හි සඳහන් කමිටුව දිස්ත්‍රික් ලේකම්වරු/දිසාපතිවරුන්ගේ නිර්දේශ මත මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ඇත.

**"මේ මහපොළව සහ ගහකොළ මිනිසාට මෙන්ම අහසේ පියාසරන සියොතුන්ට ද මිහිමත සරන සිවුපාවුන්ට ද සියලු සතුන්ට ද එකසේ අයිතිය"**
"இப் பூமியும், மரஞ் செடி கொடிகளும் மனிதனுக்குப் போன்றே வானில் பறந்து திரியும் பறவைகளுக்கும், பூமியில் வாழும் உயிரினங்களுக்கும், அனைத்து விலங்குகளுக்கும் ஒருமித்துச் சொந்தமானது"
"This great earth and the flora on it equally belong to the man and the birds flying in the sky, the quadrupeds and all creatures living on earth"

   v. ඉහත iv හි සඳහන් කමිටුව මසකට එක්වරක් වත් රැස්විය යුතු අතර අවම වශයෙන් සාමාජිකයින් පස් දෙනෙකුවත් (05) එයට ඇතුලත් විය යුතුය.

03. පස් හා බොරළු කැණීම හා ප්‍රවාහනය සම්බන්ධයෙන් ලබා දී ඇති බලපත්‍ර සම්බන්ධයෙන් පොලිසිය දැනුවත් කිරීම හා අවශ්‍ය අවස්ථාවල අක්‍රමිකතා වැළැක්වීමට පොලිසියේ සහයෝගය ලබා ගැනීමට කටයුතු කළ හැකිය. විශේෂයෙන් පස් හා බොරළු ප්‍රවාහනයේ දී බලපත්‍ර තිබේදැ යි පොලිසිය විසින් පරීක්ෂාවට ලක් කළ යුතු ය.

04. මෙහිදී පස් හා බොරළු අවශ්‍ය වන ජාතික හා ප්‍රාදේශීය වශයෙන් වැදගත්කමක් ඇති සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතියට බාධා නොවන සේ ඉහත විධිවිධාන යොදා ගැනීමේ ක්‍රමවේදයන් මෙම අමාත්‍යාංශයේ අනුමැතියට යටත්ව දිස්ත්‍රික් ලේකම්/දිසාපතිවරුන් විසින් අවස්ථානුරූපීව සකස් කර ගත යුතු වේ.

05. විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දෙන තුරු <u>වාණිජ පරමාර්ථයෙන් පස් හා බොරළු කැණීම්</u> සිදුකිරීමට භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය වෙතින් කරනු ලබන ඉල්ලීම් සඳහා එම කාර්යාංශය විසින් සළකා බලනු නොලැබේ.

06. මෙම චක්‍රලේඛයේ විධිවිධාන 2015 ඔක්තෝබර් 15 දින සිට දිවයින පුරා ක්‍රියාත්මක කිරීමට කටයුතු කල යුතු ය.

උදය ආර්. සෙනෙවිරත්න
ලේකම්

පිටපත්:

1. ජනාධිපති ලේකම් - කරු. දැ.ගැ.ස.
2. අග්‍රාමාත්‍ය ලේකම් - කරු. දැ.ගැ.ස.
3. ලේකම් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
   රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශය
4. සෙසු සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
5. විගණකාධිපති - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
6. පොලිස්පති - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
   ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව
7. සභාපති - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
   භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය
8. සභාපති - කරු. දැ.ගැ.ස. හා අ.ක.ස.
   මධ්‍යම පරිසර අධිකාරිය